**ද්විතියික නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය (ණය අංක 2758 - එස්ආර්අයි) - 2012**

---

**1. මතය**

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර , මාගේ මතය වනුයේ

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව හා 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මූල්‍ය කාර්ය සාධනය

------------------------

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව , 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.339,646,667 ක් වූ අතර, 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.457,318,532 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| **විෂයය** | **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම** | | **2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම** |
|---|---|---|---|
| -------- | ---------------------------------------- | | ---------------------- |
| | **<u>2012</u>** | **<u>2011</u>** | |
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ | 334,789,848 | 18,325,128 | 353,114,976 |
| උපදේශක සේවා | 58,670,926 | 39,283,724 | 97,954,649 |
| වර්ධක මෙහෙයුම් පිරිවැය | 4,263,954 | - | 4,263,954 |
| පොලී ගාස්තු (අතිරේක) | 1,921,939 | 63,013 | 1,984,953 |
| | -------------- | -------------- | ----------------- |
| එකතුව | **<u>399,646,667</u>** | **<u>57,671,865</u>** | **<u>457,318,532</u>** |

### 2.2 අග්‍රිම අරමුදල් ගිණුම

----------------------

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකිවූ තොරතුරු අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් හා එදිනට එම ගිණුමේ පැවති ශේෂය පහත දැක්වේ.

| | <u>එජඩො</u> | <u>රු.</u> |
|---|---|---|
| 2012 ජනවාරි 01 දිනට ශේෂය | නැත | නැත |
| එකතුකළා :- ඌන පුරණයන් | 1,663,663 | 205,078,526 |
| විදේශ විනිමය වාසිය | - | 8,488,800 |
| | ------------- | ---------------- |
| | 1,663,663 | 213,567,326 |

| | | |
|---|---|---|
| අඩුකළා :- ආපසු ගැනීම් | 604,645 | 78,901,756 |
| | ------------- | ------------- |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,059,018 | 134,665,570 |

**3. විගණන නිරීක්ෂණ**

---------------------

**3.1 ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා රජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර එළඹි ණය ගිවිසුම ප්‍රකාරව අරමුදල් සපයනු ලබන නියෝජිතායතනය විසින් අයකරන ලද රු.3,205,794 ක් වූ පොලිය, පොලී වියදම් හා ආසියානු සංවර්ධන බැංකු ණය ලෙස ගිණුම් කළ යුතු වුවද, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2012 වර්ෂය සඳහා ගෙවන ලද රු.1,984,953 ක් වූ පොලිය, ශ්‍රී ලංකා රජය හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර එළඹි අතිරේක ණය ගිවිසුම ප්‍රකාරව ව්‍යාපෘතියේ පොලී වියදම් හා ගෙවිය යුතු පොලී ලෙස ගිණුම්ගත කර තිබුණි. එබැවින් 2012 වර්ෂය සඳහා පොලී වියදම් හා ආසියානු සංවර්ධන බැංකු ණය පිළිවෙලින් රු.1,220,841 කින් හා රු.3,205,794 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) කොන්ත්‍රාත්කරුවන් හතර දෙනෙකුට ගෙවිය යුතු එකතුව රු.64,578,167 ක් වූ මුදල් මහා භාණ්ඩාගාරයෙන් කිසිදු සීමා කිරීමකින් හෝ එකඟත්වයක් ලබාගැනීමෙන් තොරව මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු අරමුදල් හා ශ්‍රී ලංකා රජයෙන් දායකය ලෙස ගිණුම්ගත කර තිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-------------------------------

රු.1,162,504,731 ක වටිනාකමට ණය අංක 1993 මූල්‍ය සහාය ඇතිව සිදුකරන ලද පිරිසිදු කරන ලද ජලය පොම්ප කිරීමේ ප්‍රධාන බෙදාහැරීම් නළය (කි.මී 10.5 ) සැපයීම හා එළීම සහ උස් ජල සැපයුම් ( 2 ක් ) ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව වර්ෂ දෙකක ප්‍රමාදයක් සහිතව 2011 සැප්තැම්බර් 30 දින සම්පූර්ණ කර තිබුණද, සමස්ත කාර්ය ඉටුකිරීම සඳහා ඉහත කොන්ත්‍රාත්තුවට සමානව

සම්පූර්ණ කළ යුතු වූ මූලික වැඩ හා ජලය පිරිසිදු කිරීමේ පිරියත ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සැලැස්මට වඩා ඉතා පිටුපසින් වූ හෙයින් ඉහත කාර්යය නිෂ්කාර්යව තිබුණි. 2013 ජුනි 30 දිනට සංශෝධිත ඉලක්කයන් සියයට 75 ක් ඉකුත් වී තිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය. කෙසේ වුවද එම දිනට මෙම කොන්ත්‍රාත්තුවේ සමස්ත භෞතික ප්‍රගතිය සියයට 42 ක් විය.

## 4. මූල්‍ය සමාලෝචනය

----------------------

### 4.1 අරමුදල් උපයෝජනය

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සැලසුම් කරන ලද කාල පරිච්ඡේදය තුළ වෙන්කරන ලද සම්පත් යොදා ගනිමින් ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීම තහවුරු කර ගනු වස් සමස්ත ව්‍යාපෘති කාල පරිච්ඡේදය ආවරණය වන පරිදි මාසිකව, කාර්තුමය හා අර්ධ වාර්ෂික ආදි වශයෙන් වගකීම්ද සහිතව මූල්‍ය හා භෞතික ඉලක්කයන් දක්වමින් පරිපූර්ණ විස්තරාත්මක ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතුය. කෙසේ වුවද ව්‍යාපෘතිය විසින් එම සැලැස්ම පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ලබාගත හැකිවූ තොරතුරු අනුව, 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය පහත දැක්වේ.

| | ආසබැ | ශ්‍රීලංර | එකතුව |
|---|---|---|---|
| එකඟවූ දායකය (එජඩො මිලියන වලින් ) | 13.3 | 4.87 | 18.17 |
| 2012 දෙසැම්බර් 31 දක්වා තථ්‍ය වියදම (එජඩො මිලියන වලින් ) | 2.9 | 0.7 | 3.6 |
| අරමුදල් උපයෝජනය ප්‍රතිශතයක් ලෙස | 21.8 | 14.4 | 19.8 |

(ඇ) මූල්‍යායනය හා සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය සහ 2012 දෙසැම්බර් 31 දක්වා සමුච්චිත උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| | සැපයීම සඳහා එකඟවූ මුදල | | 2012 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | වර්ෂය තුළ උපයෝජනය කළ අරමුදල් | 2012 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ අරමුදල් (මුදල් පදනම ) |
|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ආසබැ | 13.30 | 1,206.30 | 319.28 | 307.04 | 455.31 |
| ශ්‍රී ලංකා රජය | 4.87 | 511.00 | 44.16 | 39.21 | 78.49 |
| එකතුව | **18.17** | **1,717.30** | **363.44** | **346.25*** | **533.80*** |

* උපචිත වියදම්වල බලපෑම හේතුවෙන් ඉහත දැක්වෙන සංඛ්‍යා මෙම වාර්තාවේ 2.1 ඡේදයේ දැක්වෙන සංඛ්‍යා වලින් වෙනස් වේ.